# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

பொலிஸ் ஊடகப் பிரிவு

POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල


| දිනය Date | 2025.08.17 පැය 0610 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/1602/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |
|---|---|---|---|---|---|---|---|

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාතර්ා වූ වැදගත් තොරතුරු</u>**

## 01. නාඳුනන මෘත ශරීරයක් හමුවීම - තංගල්ල පොලිස් වසම.

2025.08.16 වන දින සවස් කාලයේ තංගල්ල පොලිස් වසමේ තංගල්ල රෝහල ආසන්නයේ වැටී සිටි පුද්ගලයෙකු රෝහල් ගත කිරීමේදී මියගොස් සිටි බවට තංගල්ල පොලිසියට ලද පණිවිඩයක් මත විමශර්න ආරම්භ කර ඇත.

මරණකරුගේ අනන්‍යතාව මෙතෙක් තහවුරු වී නොමැත. වයස අවරුදු 65 ක් පමණ වූ උස අඩි 05 අගල් 01 ක් වූ පුද්ගලයෙකි සුදු පැහැති ටී ෂටර්යක් හා කළු පැහැති කොට කලිසමත් හැද සිට ඇත. මෘත ශරීරය තංගල්ල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

තංගල්ල පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

## 02. මාරක රිය අනතුරක් - අනුරාධපුර පොලිස් වසම.

2025.08.16 වන දින රාත්‍රී කාලයේ අනුරාධපුර පොලිස් වසමේ අනුරාධපුර ජයන්ති මාවතේ සිංහකණුව වටරවුමේදී ජයන්ති වටරවුම දෙස සිට මාකට් හංදිය දෙසට ධාවනය වූ ඉන්ධන බවුසර් රථයක් පදික කාන්තාවකගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදික කාන්තාව අනුරාධපුර රෝහලට ඇතුලත් කිරීමෙන් පසු මියගොස් ඇත.

**මරණකාරියගේ අනන්‍යතාව තහවුරුවී නොමැති අතර ප්‍රදේශයේ සිටින යාචක කාන්තාවක් බවට අනාවරණය වී ඇත.**

මෘත ශරීරය අනුරාධපුර රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර අනතුර සම්බන්ධයෙන් බවුසර් රථයේ රියදුරු අත්අඩංගුවට ගෙන ඇත. අනුරාධපුර පොලිසිය වැඩිදුර විමශර්න සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**